විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

මහලේකම් කාර්යාලය, මාළිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை செயலகம், மாளிகாவத்தை, கொழும்பு 10. Maligawatte Secretariat, Maligawatte, Colombo 10.

අංකය / இல. / No. විවැ/චක්‍රලේඛ/2010    දිනය / திகதி / Date 2010- 08- 10

**විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 02/ 2005 (1)**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් ,
පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිසා ලේකම්වරුන්/ ප්‍රාදේශීය ලේකම්වරුන්.

**රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය ක්‍රියාත්මක කිරීම යටතේ තනතුරු අහෝසිවීම මත විශ්‍රාම ගැන්වීම**

උක්ත කරුණට අදාලව මවිසින් නිකුත් කරන ලද 2005- 02- 02 දිනැති විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු චක්‍රලේඛ 2/ 2005 චක්‍රලේඛයට ඌන පූරණයක් ලෙස මෙම චක්‍රලේඛය නිකුත් කරමි.

2004- 01- 01 දින සිට 2004- 12- 23 දක්වා විශ්‍රාමයාම හේතුවෙන් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය වීමට අවස්ථාව නොලැබූ නිලධාරීන් කල්පිත පදනම මත 2004- 01- 01 දින සිට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය කිරීම 2010- 05- 26 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමත කොට ඇත.

ඒ අනුව 2004- 01- 01 දින සිට 2004- 12- 23 දින දක්වා කාලය තුළ විශ්‍රාම ගිය නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් නව වැටුප් පරිමාණය අනුව සංශෝධනය කළ යුතුය. ඒ අනුව ඔවුන්ට සංශෝධිත විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක් හිමිවන අතර, විශ්‍රාම ගිය දින සිට සංශෝධිත මාසික විශ්‍රාම වැටුපකට හිමිකම ලැබේ. ඒ අනුව සංශෝධිත විශ්‍රාම වැටුප් අයදුම්පත් මෙම දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතුය.

කේ.ඒ. තිලකරත්න
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්: 01. ලේකම් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
02. විගණකාධිපති


| | Telephone | Fax | | Telephone | Fax | | Telephone | |
|---|---|---|---|---|---|---|---|---|
| Director General | 2431647 | 2342078 | W&OP | 2332346 | 2432214 | Policy | 2329580 | |
| Director | 2432008 | 2342078 | PSPF | 2324375 | 2332347 | Forces | 2320439 | |
| Director (F) | 2434974 | 2391403 | L.G.U. | 2342525 | 2342525 | Computation | 2434414 | E-mail: pensions@sltnet.lk |
| Internal Auditor | 2329634 | 2329634 | Registration | 2329178 | - | Payments | 2431612 | Web site: www.pensions.gov.lk |